සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

| 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය I | පැය 1 |
|---|---|---|

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 40 තෙක් ඇති ප්‍රශ්නවල (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරා ලියන්න.**

---

01. වත්මන් සමාජයේ යහපත් වැඩ කරන්නන්ට **අකුල් හෙළන** පිරිස් වැඩි බව සභාපතිතුමා පැවසුවේ ය.
    (1) සහයෝගය දක්වන (2) බාධා කරන (3) අකුල්වලින් පහර දෙන (4) වංචා කරන

02. ගුරුවරයා ඇසූ ප්‍රශ්නයට දෙමව්පියන් **මුනිවත රකිනු** අපි දුටුවෙමු.
    (1) අනුමැතිය දක්වනු (2) හොඳින් අසා සිටිනු (3) නොසලකා හරිනු (4) නිහඬ ව සිටිනු

03. භාෂාව **යාන්තමින් කට ගාගත්** ඇතැමුන් ඊට හානි කරන බව මහාචාර්යතුමා සඳහන් කරයි.
    (1) යන්තමින් කතා කිරීමට දත් (2) යන්තමින් ලිවීමට දත්
    (3) යන්තමට උගත් (4) කතාකිරීමට හා ලිවීමට නොදත්

04. කපු මහතාගේ අනවශ්‍ය **පාරට්ටුව** පිළිබඳ ව ඥාතීන් තුළ වූයේ නොසතුටකි.
    (1) වර්ණනාව (2) කතා බහ (3) හෙළා දැකීම (4) තොරතුරු

- **අංක 5, 6 ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

05. මහාචාර්ය සේනක බිබිලේ ...................... ධෛර්යයෙන් යුතු ව ජීවිතය ජයගත්, ආදර්ශවත් චරිතයකි.
    (1) ප්‍රශස්ත (2) උත්කෘෂ්ට (3) අප්‍රතිහත (4) කෘතහස්ත

06. වෙස්සන්තර ජාතක කාව්‍යය ......................... සාහිත්‍යයෙන් බැහැර වූ කෘතියක් ය යන්න විචාරක මතයයි.
    (1) ප්‍රවීණ (2) විදග්ධ (3) ව්‍යක්ත (4) සාම්ප්‍රදායික

07. අකාරාදී පද පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
    (1) ජූලි, නොවැම්බර්, පෙබරවාරි, සැප්තැම්බර් (2) ලංකාදීප, දිවයින, අරුණ, රිවිර
    (3) උදය, රාත්‍රිය, සවස, දහවල (4) ජපානය, චීනය, රුසියාව, ප්‍රංශය

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
    (1) ලේඛනාගාරය, සන්දර්ශනය, වීරෝදාර, යතාර්තය (2) අර්භූදය, ඡායාව, ප්‍රතිඵල, වීරෝධාර
    (3) පිළිවෙල, කොට්ඨාසය, ව්‍යංගාර්ථය, පුස්ථකාලය, (4) අත්‍යවශ්‍ය, කෞශල්‍යය, ස්වාභාවික, නීත්‍යනුකූල

09. එක් එක් වචනයෙහි මුලකුරෙහි දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා කෙටි ඇදය යෙදුණු වරණය වන්නේ,
    (1) පීරිසිය, කුඩලිගම, මැහැල්ල, පානදුර ය. (2) සීගිරිය, රුවන්පුර, වාසනාව, පැරැන්නන් ය.
    (3) මීරිගම, පූජාවලිය, කැමැත්ත, මාලිමාව ය. (4) වීරයෙක්, දැවැන්ත, කාරණාව, මුලතිව් ය.

10. සඤ්ඤක අක්ෂරයක්, නාසික්‍ය අක්ෂරයක්, ඌෂ්මාක්ෂරයක්, අන්තඃස්ථාක්ෂරයක් පිළිවෙළින් යෙදුණු පිළිතුර තෝරන්න.
    (1) ළ, න, ෂ, ර (2) ග, ණ, ළ, ව (3) ඬ, ඥ, හ, ල (4) ඦ, ම, ෆ, ,ය

11. නිර්මාණ පසුබිම, වස්සානේ, ආවර්ජනා, බෝඩිම යන කෘතිවල කතුවරුන් පිළිවෙළින් දැක්වෙන වරණය වනුයේ,
   (1) ඒ.වී. සුරවීර, මහගමසේකර, රත්න ශ්‍රී විජේසිංහ, ගුණදාස අමරසේකර
   (2) ඒ.වී. සුරවීර, රත්න ශ්‍රී විජේසිංහ, ගුණදාස අමරසේකර, මහගමසේකර
   (3) ගුණදාස අමරසේකර, රත්න ශ්‍රී විජේසිංහ, මහගමසේකර, එ.වී සුරවීර
   (4) මහගමසේකර, ඒ.වී. සුරවීර, ගුණදාස අමරසේකර, රත්න ශ්‍රී විජේසිංහ

12. "...නාදන් නො වෙද
    බේර ගත්තේ එදින
    **පිච්ච මල් හදවතින්**
    ලේ දෙමින්..." මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද්‍ය පාදය,
   (1) උපමාවකි. (2) ව්‍යංගාර්ථයකි. (3) රූපකයකි. (4) අනුප්‍රාසයකි.

13. 'නළවයි' යන ක්‍රියා පදයේ අතීත කාල, බහුවචන, උත්තම පුරුෂ රූපය ඇතුළත් වරණය වන්නේ,
   (1) නැළවීමු (2) නැළවීහු (3) නැළවෙහි (4) නැළවෙමු

14. උක්ත නාම පද **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) දරුවෝ, ගොවියෙක්, ගුරුවරුන්, අපි (2) මිනිස්සු, ගැහැනියක්, මම, තොප
   (3) සිංහයෝ, පුත්තු, ඇතැමෙක්, ඔවුහු (4) ශිෂ්‍යයෝ, වෙළෙන්දෝ, තොපි, ළමයකු

15. උපසර්ගයක් යෙදී **නොමැති** වචනයක් සහිත වරණය වන්නේ,
   (1) නිහඬ, පරිවර්තන, විශිෂ්ට, සාමාජික (2) සංවාද, ප්‍රතිපෝෂණ, අමනාප, නිර්වින්දන
   (3) අතිමහත්, ඉමහත්, සුවිනීත, සම්බන්ධය (4) අවමඟුල්, පබල, දුදන, නිශ්ශබ්ද

- **16 සිට 19 තෙක් ඇති ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත පදයට ගැළපෙන වරණය තෝරන්න.**

16. " තොස් වන සුවඳ පිරිබඩ මල් **ගෙන** අතට"
   (1) මිශ්‍ර ක්‍රියාවකි. (2) විධි ක්‍රියාවකි. (3) අසම්භාව්‍ය ක්‍රියාවකි. (4) පූර්ව ක්‍රියාවකි.

17. " උඹ **මිනිහෙක්** වෙයන් පුතේ - කුසගිනි වෙයි එක ම සතුරු"
   (1) සර්ව නාම පදයකි. (2) ප්‍රථම පුරුෂ නාම පදයකි.
   (3) උත්තම පුරුෂ නාම පදයකි. (4) මධ්‍යම පුරුෂ නාම පදයකි.

18. "**අබ සැට ලාසක් පුපුරන ලෙසිනි**
   (1) උපමාවකි. (2) නාම පදයකි. (3) රූපකයකි. (4) අනුප්‍රාසයකි.

19. "එක්සත් **වෙළෙඳ** සංගමයේ වාර්ෂික රැස්වීම උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණි.
   (1) නිපාත පදයකි. (2) ධාතු ප්‍රකෘතියකි. (3) ක්‍රියා විශේෂණයකි. (4) නාම විශේෂණයකි.

20. මූර්ධජ **අක්ෂර** පමණක් යෙදුණු වරණය තෝරන්න.
   (1) ට,ඩ,ණ,ර,ෂ (2) ඍ,ර,ෂ,ශ,ඪ (3) න,ත,ද,ධ,ථ (4) ම,බ,ප,ඵ,෴

21. වැරදි ලෙස යෙදී ඇති තනි පදයක් සහිත වරණය තෝරන්න.
   (1) පසු පස එලවා යාම - ලුහුබැඳීම (2) පුරාතන කාලයට අයත් දේ - පුරාවස්තු
   (3) හතරැස් හැඩයෙන් යුක්ත වූ - සමචතුරස්‍රාකාර (4) ජීවත් වීමට ගන්නා ක්‍රියාමාර්ග - ජීවනෝපාය

22. පහත අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි නගර නාමය වනුයේ,
   (1) ඩු,හි,ක,ව,ක්,ක (2) ව,ර,හ,නු,ම (3) ග්,ල,කො,ල,ක් (4) ව,බේ,ල,රු,ව

23. නිවැරදි ව විරාම ලකුණු යෙදූ වාක්‍යය තෝරන්න.
   (1) "කමත" නැතහොත් "කලවිට" ගැමියන් අසීමිත භක්තියකින් සැලකූ ස්ථානයකි.
   (2) මැණියනි, අප මේ පැමිණියේ සමන්කූට පර්වතය අසල පිහිටි රත්නපුර නගරයට ය.
   (3) "මට බැරි වෙයි ද මේ ළමයි එක්කලා දුවලා දිනන්න."
   (4) දෙවන අග්බෝ රජු (ක්‍රි.ව.601-611) ථූපාරාමය ප්‍රකෘති කරවීමෙන් පසු, සිත්තම් කරවී ය.

24. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) පසිඳු - ප්‍රචලිත, පුවතර, පතළ, උතුම් (2) ප්‍රයත්නය - තැත, වෙර, උත්සාහය, යත්නය
(3) චන්ද්‍රයා - උළිඳු, නිශාකර, තරුපති, හිමකර (4) වනය - අරණ, අටවිය, බැද්ද, වල

25. පහත දී ඇති කවියේ හිස් තැන පිරවීම සඳහා සුදුසු කවි පදය තෝරන්න.

මැනලා වී දෙකක් නොලැබී මල්ලකට
දරුවොත් එක්ක මම වැටිලා ඉන්නකොට
අම්මා ඇවිල්ලා හීනෙන් දොරකඩට
..........................................................................................

(1) ඉන්නේ කවුද රකවරණෙට බැල්මකට (2) නන්නාඳුනන මෙනුවර තනි වුණ අපට
(3) යම්දෝ හෙට උදේ අපි ආපසු ගමට (4) ඇහුවා මගෙ පුතේ කිරි ඕනැද උඹට

26. නිත්‍ය බහුවචන පදයක් හා ක්‍රියා විශේෂණ පදයක් **ඇතුළත් වන** වාක්‍යය තෝරන්න.

(1) කිසිවෙක් ඒ ගැන මගෙන් අසා සිටියහ. (2) අයෙක් අහස දෙස විස්මයෙන් බලති.
(3) ඇතැමෙක් අලංකාර ඇඳුම් ඇඳ නටති. (4) බියපත් සතුන් දුටු සමහරෙක් ලුහුබැන්දහ.

- **අංක 27, 28 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

**27.** "කොතැන සිටියත් වැදගතා වැදගතෙක්ම වෙයි."

(1) කසළ ගොඩේ තිබුණත් මැණික මැණිකමයි. (2) තිත්ත තිබ්බටු තෙලෙන් බැද්දත් තිත්තලු.
(3) ආරේ ගුණ නැරේ. මල්ල කිහිල්ලෙන් නැරේ. (4) බල්ලෙක් බිරුවට කන්දක් පාත්වෙන්නෙ නෑ.

28. "අසත්පුරුෂයන් දෙදෙනෙකුගේ එකතුවකි."

(1) කිරි මුහුදට හඳ පෑව්වා වගේ (2) ජාඩියට මූඩිය වගේ.
(3) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ. (4) රයිගමයයි ගම්පළයයි වගේ.

29. **හෙද කාර්ය මණ්ඩලය රෝගීන් එන්නත් කළහ.** මෙම වාක්‍යය නිවැරදි කර්මකාරක වාක්‍යයක් ලෙස දැක්වූ විට,

(1) හෙද කාර්ය මණ්ඩලය විසින් රෝගීන් එන්නත් කරනු ලැබුණහ.
(2) හෙද කාර්ය මණ්ඩලය විසින් රෝගීන් එන්නත් කරන ලදහ.
(3) හෙද කාර්ය මණ්ඩලය විසින් රෝගීන් එන්නත් කරනු ලැබේ.
(4) හෙද කාර්ය මණ්ඩලය විසින් රෝගීන් එන්නත් කරනු ලබයි.

30. A - සින්ධූපමාන - සාගරය හා සමාන
B - සක්වා ලිහිණි - පරාක්‍රම කොඩිතුවක්කු
C - රන් රෝස - ආරියවංශ රණවීර
D - සබවස - අභ්‍යවකාශය
A, B, C, D යෙදුම් අතරින් නිවැරදි යුගල වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) AC හා D පමණි. (4) A B හා D පමණි.

31. "හැමෝ ම ඇවිල්ලා ඒගොල්ලන්ට උදවු කරා."
ඉහත වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ,

(1) හැමෝ ම ඇවිත් ඔවුන්ට උදවු කළහ. (2) සැම දෙනා ම ඇවිත් ඔවුන්ට උදවු කළහ.
(3) ඔක්කෝ ම අය පැමිණ ඔවුන්ට උදවු කළහ. (4) සැම දෙනා ම පැමිණ ඔවුන්ට උදවු කළහ.

32. වසංගතය රට පුරා **පැතිරෙද්දී** ජනතාව සෞඛ්‍ය පිළිවෙත් ආරක්ෂා කිරීමට පෙළඹෙති.
තද කළු අකුරින් මුද්‍රිත පදය අයත් වන ක්‍රියා වර්ගය වන්නේ,

(1) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ය. (2) මිශ්‍ර ක්‍රියා ය.
(3) ප්‍රයෝජ්‍ය ක්‍රියා ය. (4) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා ය.

33. A - සියලු දෙනා එක් ව පින් ............. ඔහුට නිවෙසක් තනා දුන්හ.
B - අඛණ්ඩ ව වැසි වැටුණු ................ ගොවීන්ට වගා කටයුතු කළ නො හැකි විය.
C - පියා දරුවන් ................ උදෑසනින් නගරයට ගියේ ය.
D - 'වසංගතවලින් තොර සෞභාග්‍යවත් කාලයක් ............ උදාවේවා!' යන්න අපේ පැතුමයි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

**E - බැවින්** **F - යළි** **G - කැටුව** **H -තකා**

(1) E, F, G, H (2) G, H, E, F (3) H, E, G, F (4) F, G, E, H

34. සිංහල නාට්‍යය සම්බන්ධයෙන් **වැරදි ලෙස** යෙදුණු පද යුගලයක් වන්නේ,
(1) ගුරු තරුව - දයානන්ද ගුණවර්ධන (2) තල මල පිපිලා - ජයලත් මනෝරත්න
(3) පුංචි අපට දැන් තේරෙයි - සෝමලතා සුබසිංහ (4) මනමේ - එදිරිවීර සරච්චන්ද්‍ර

35. දියවර මංගල්‍යය යනු
(1) බුදුන් හා දෙවියන් වෙනුවෙන් කරන පූජා මංගල්‍යයකි.
(2) ප්‍රථම වරටකුඹුරෙන් ගොයම් කැපීමේ මංගල්‍යයකි.
(3) කමත ඉදිකර වැඩ ආරම්භ කිරීමට පෙර කමතේ කිරි ඉතිරිවීමේ මංගල්‍යයයි
(4) වැ කන්ද මත කිරි උතුරුවා සුබ නැකතින් ජලය ගොවිබිම්වලට නිකුත් කිරීමේ මංගල්‍යයයි.

36. චිරන්තන සාහිත්‍යික උක්තීන් භාවිතයට ගන්නා නූතන සාහිත්‍යකරුවා උත්සාහ කරන්නේ **ධ්වනිපූර්ණ** යෙදුම් මගින් චමත්කාරයක් දැනවීමටයි. තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය වන්නේ,
(1) කාව්‍යය සඳහා යොදා ගන්නා කියමන්
(2) මතුපිට අර්ථය ඉක්මවා යන සැඟවුණු අර්ථයකින් පෝෂණය වූ
(3) සාහිත්‍ය හා කලා නිර්මාණය සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම
(4) ජීවන තක්සලාවෙන් ලබන පරිණත බුද්ධිය හා බහුශ්‍රැත බව.

- **අංක 37, 38 දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල වාක්‍යය තෝරන්න.**

37. (1) ඔහු ප්‍රවීණ ගායකයකු ද?
(2) නුඹලා විනයගරුක දරුවන් වෙහු.
(3) දරුවන් යහ සෞඛ්‍ය පුරුදු සඳහා හුරු කරනු වටී.
(4) සිරකරුවෝ නිදහස ලබන්නේ කවදා ද?

38. (1) සොරුන් සතර දෙනෙක් පාපොච්චාරණය කළහ.
(2) විශාඛා තොමෝ කිරිපිඩු රැගෙන ගියහ.
(3) සිසුහු පාසල් පැමිණ නැත.
(4) අප අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන්නේ මොනවා ද?

39. (1) අපි නීතිගරුක පුරවැසියන් වෙමු .
(2) අප නිතිගරුක පුරවැසියන් වෙමු.
(3) අපි නීති ගරුක පුරවැසියන් වෙමු .
(4) අප නීති ගරුක පුරවැසියෝ වෙමු.

40. දී ඇති අදහසට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.
"අන් සියලු සාහිත්‍ය නිර්මාණවල දී මෙන් ම කෙටිකතා නිර්මාණයේ දීත් බහුශ්‍රැතතාවත්, සතතාභ්‍යාසයත් සාර්ථකත්වය සඳහා ඉවහල් වන බව සිහිපත් කළ යුතු ය.
(1) සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කිරීම සඳහා බොහෝ කෙටිකතා කෘති පරිශීලනය මෙන් ම නිරන්තර පුහුණුව ද අත්‍යවශ්‍ය ය.
(2) අනෙකුත් සාහිත්‍ය නිර්මාණ කිරීම සඳහා ද බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවත්, නිරන්තර අභ්‍යාසයත් ඉවහල් වේ.
(3) කෙටිකතාවක සාර්ථකත්වය උදෙසා කෙටිකතාකරුවා බොහෝ ඇසූ පිරූ තැන් ඇති, නිරතුරු අභ්‍යාසයෙහි යෙදෙන්නකු වීම අත්‍යවශ්‍ය ය.
(4) බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවත්, සාර්ථක කෙටිකතාවක් නිර්මාණය කර තිබීමත් හොඳ සාහිත්‍යකරුවකු වීමට අවශ්‍ය අත්‍යවශ්‍ය අංග වේ.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

# දෙවන වාර පරීක්ෂණය 2021
# Second Term Test

| 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය II | පැය 2 යි |
|---|---|---|

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ළකුණු ගණන 80 කි.**

- **අංක (I) සිට (X) තෙක් ඇති සියලුම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් , එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

---

01)

I. සිංහල අක්ෂර මාලාවෙහි ,
(අ ) ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
(ආ) අඝෝෂ අක්ෂර දෙකක් ලියා දක්වන්න.

II. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍යය දෙකක් ලියන්න.
(අ ) සුළු
(ආ) සුලු

III. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය . එම වචන දෙක තද කළු අකුරින් නිදොස් කර ලියන්න .
“අවස්ථාවෝචිත පරිදි වියත් වහර හා කට වහර සම්මිශ්‍රණය කරමින් නිර්මාණකරනයේ යෙදීමටද නිර්මාණකරුවා සමත් වන්නේය .”

IV. “ බලයි ” යන ක්‍රියා පදයෙන්,
(අ ) විධි ක්‍රියා පදයක්
(ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා පදයක්
සකස් කර ලියන්න .

V. පහත සඳහන් (අ) හා (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස්ය .ඒවා නිදොස් කර නැවත ලියන්න .
(අ ) ශිෂ්‍යයන් පස්දෙනක් පාසලට පැමිනියහ.
(ආ) අපි වසංගත රෝගවලින් නිදහස් වන්නේ කවදාද?

VI. පහත සඳහන් පදවල අර්ථය ලියන්න .
(අ ) චිරන්තන
(ආ) සින්ධූපමාන

VII. පහත දැක්වෙන නාමපදවල ප්‍රකෘති හා ප්‍රත්‍ය වෙන්කර ලියන්න.
(අ ) දරුවෝ
(ආ) වැද්දා

VIII. පහත දැක්වෙන රූඪී වලින් පළවන අර්ථය ලියන්න .
(අ ) දිව දෙකේ මිනිහා
(ආ) බක තපස් රැකීම

IX. පහත සඳහන් කතෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.
(අ ) අපි වසංගත රෝග මැඩලීමට සෞඛ්‍ය පුරුදු පිළිපදිමු.
(ආ) දරුවෝ ආදරයෙන් දෙමව්පියන් පෝෂණය කළහ.

X. පහත සඳහන් පරමිත භාෂා , ව්‍යවහාර පොදු ව්‍යවහාරයෙන් ලියන්න.

(අ ) හේමලයා
(ආ) අත්තප්පා

( ලකුණු 2*10 = 20)

02) පහත සඳහන් (අ) ,(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. වරහන් තුල ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න.

(අ) අතීතයේ සිට ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත රාජ්‍යයක් විය . එකල පැවති කාබනික පොහොර භාවිතය වෙනසකට පත්වී රසායනික පොහොර භාවිතයට හුරු වූයේ විවෘත ආර්ථිකයෙන් පසුවය. රසායනික පොහොර හා රසායනික බෙහෙත් වර්ග භාවිතය නිසා ලක්වැසියාගේ ආහාර රටාවට වස විස එකතු වීම නිසා විවිධ රෝගාබාධ වලට ගොදුරු වීම විශාල ගැටලුවකි.විෂ සහිත ආහාර පරිභෝජනය කරන රටවල් අතරින් ලංකාව ප්‍රථම ස්ථානයේ ඇත. එබැවින් කාබනික පොහොර භාවිතය දේශීය ආර්ථිකයට හා සමාජයට බලපෑමක් කළ හැක්කේ කෙසේ දැයි විමසුමට ලක්කළ යුතුය.

(ආ) තාක්ෂණික මෙවලම් භාවිතය නිසා මිනිසාගේ බොහෝ වැඩ කටයුතු පහසු කරයි.පරිගණකය හා ජංගම දුරකථනය මිනිස් ජීවිතයට වැඩි බලපෑමක් කිරීමට සමත් විය. මෙම මෙවලම් භාවිතයෙන් සයිබර් අවකාශයේ සැරිසරා ඕනෑම විෂය ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් බොහෝ දැනුම් සම්භාරයක් ළඟා කර ගැනීමට අවකාශය උදා වී ඇත. නමුත් ලාංකේය තරුණ පරපුර ඒ යහපත් ප්‍රතිඵලයට වඩා අයහපත් ප්‍රතිඵලය ළඟා කර ගැනීමට සමත් වී ඇති බව අද සමාජයේ උද්ගත වී ඇති බොහෝ ගැටලුකාරී තත්ත්වයන්ගෙන් පැහැදිලි වේ.මෙම මෙවලම් දැන හඳුනාගෙන පරිහරණය කිරීමට සුදුසුම කාලය එළඹ ඇත.

(ඉ) ශ්‍රී ලංකීය සමාජය සංස්කෘතික හර පද්ධතීන් සමාජගත කිරීමට විවිධ චාරිත්‍රවාරිත්‍ර ආශ්‍රිත විවිධාකාර උත්සවයන් පවත්වයි. විශේෂයෙන් මංගල හා අවමංගල උත්සව බෞද්ධ ආගමික උත්සව ඉතාමත් උත්කර්ෂවත්ව සම්පත් හා කාලය නාස්ති කරමින් දැඩි තරඟකාරිත්වයකින් යුතුව පැවැත්වීමට පුරුදු වී ඇත. එය ලාංකිකයාගේ අනන්‍යතාවයකි. හරසුන් මෙවැනි ක්‍රියා පටිපාටීන් පරිවර්තනයකට ලක් කිරීමට 2019 වර්ෂයේ අවසාන භාගයේ සිට ලොව පුරා පැතිරුණු කොවිඩ් වසංගතය සමත් විය. ඒ අනුව කොවිඩ් වසංගතය ශ්‍රී ලංකා සමාජයේ වැසියන්ගේ ජීවිත උඩියටිකුරු කරමින් අපූරු පාඩමක් පුහුණු කළේය.

(ඊ) ලෝකයේ ඕනෑම රටක අතීත ශ්‍රී විභූතිය හා ප්‍රෞඪත්වය රඳා පවතින්නේ ඒ ඒ රටවල් පුරා විසිරී පවතින පුරාවස්තු මඟිනි . ශ්‍රී ලංකාවේ ද විවිධ රාජධානිවල ඇති පුරාවස්තු මෙරට ප්‍රෞඪත්වය ලොවට හඬ ගා කියයි.එවැනි පුරාවස්තු ආරක්ෂා කිරීම රටේ පුරවැසියන්ගේ ප්‍රධාන වගකීමකි. එහෙත් ලංකාවේ පවතින බොහෝ පුරාවස්තු දේශපාලනඥයින්ගේ ,නිධන් හොරුන්ගේ හා මංකොල්ලකරුවන්ගේ ක්‍රියා කලාපයන් නිසා අභාවයට පත්ව යන බව ජනමාධ්‍යයෙන් වාර්තා වේ.ලංකාවේ පුරාවස්තු රැක ගැනීමේ කාර්යයට සහාය වෙමු.

(ලකුණු 25 යි)

03) පහත දැක්වෙන පාඨය වචන 55- 85 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

මිනිසාගේ අවධානය පොළෝ තලය ඉක්මවමින් අභ්‍යවකාශය වෙතද යොමු වී ඇති මේ යුගයේ දී ළමයාගේ බුද්ධිමය නිම්වළලු නිරතුරුව පුළුල් වෙමින් පැවතිම කාලීන අවශ්‍යතාවකි.එය සිදු කළ හැකි වන්නේ නූතන සන්නිවේදන මෙවලම් නිරතුරුව පරිශීලනය කිරීමේ මාර්ගයෙනි. එහෙත් මෙහිලා අමතක නොකළ යුතු කරුණක් වන්නේ ළමයා දැනුම ග්‍රහනය කිරීම කෙරෙහි සිය එල්ලය යොමු කරමින් ඒ පසුපස හඹා යැමේදී ,එය සිදු කල යුත්තේ තමා වසන සමාජය හා අවට පරිසරය තුළ පය ගසා සිටිමින් බවය .එසේ නොවුවහොත් ඔහු මුල් උදුරාදැමූ ගසක් මෙන් බුද්ධිමය ලෝකය තුල අතරමංවීමෙන් රොබෝ කෙනෙකු බඳු යාන්ත්‍රික මිනිසෙකු බවට පත්වීමට ඇති ඉඩකඩ බොහෝය. මෙහි දී ඔහුගේ දෙමව්පියන් හා ගුරුවරුන් විසින් ද ඉටු කළ යුතු එක් භූමිකාවක් ඇත.එනම්, ඔහුට බාධාවක් නොවන සේ ඔහු පසෙකින් සිට අධීක්ෂණය කරමින් නිසි මං ඔස්සේ ඔහු මෙහෙයවීමය . පූර්ණ ජීවිතයකට බුද්ධිමය වශයෙන් අත්කර ගන්නා ජයග්‍රහණ සමඟම සාරධර්ම පිළිබඳ චර්යා මත ගොඩ නැගුණු සමතුලිතභාවයක් පවත්වාගෙන යැමද අතිශයින් වැදගත් කරුනක් වේ .

(ලකුණු 10 යි)

04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

ක්‍රි.පූ. යුගවල සිටම ද්විභාෂක ලේඛකයන් සාහිත්‍යකරණයෙහි නිරත වූ බවට අප්‍රමානික සාධක හමුවෙයි. ඒ අතර දෙමළ,සිංහල,පාලි,සංස්කෘත වැනි භාෂා මනාව දත් පඬුවන් බෙහෙවින් සිටි බව මහාවංසය, දීපවංසය වැනි ග්‍රන්ථ වලින්ද සනාථ වෙයි.ත්‍රිපිටක පාලියට අටුවා සම්පාදනය කිරීම සඳහා ඉන්දියාවෙන් වැඩම කළ බුද්ධඝෝෂ හිමියන්ගේ මව්භාෂාව තෙළිඟු බව මහාවංසය සඳහන් කරයි.තවද බුද්ධඝෝෂ හිමියන්ගේ ඇවෑමෙන් අට්ඨකථාකරණය සඳහා ඉන්දියාවෙන් මෙරටට වැඩම කළ ‘ධම්මපාල’ හිමියන්ගේ මව්භාෂාවද දෙමල බව ඓතිහාසික තොරතුරු වලින් හෙළිවේ.බොහෝ කාලයක්

ලාංකාවේ ජීවත් වෙමින් මුන් වහන්සේලා කළ සේවය අප්‍රමාණය.ශාසනික වශයෙන් මෙන්ම ශාස්ත්‍රීය වශයෙන්ද උන්වහන්සේලා කළ කාර්යයන් අදටත් අමරණීය ය.එබැවින් ඔවුන්ගේ සමාජ හා ශාස්ත්‍රිය කාර්යයන් ඔස්සේ දෙමළ වචන ,දෙමළ භාෂාගත යෙදුම් සිංහලයට ඇතුළු නොවන්නට ඇතැයි කාට කිව හැකිද?

මීට අමතරව II වන පරාක්‍රමබාහු රජතුමා බොහෝ පඬුරු ඉන්දියාවේ සොළී රජතුමාට යවා පිටකත්‍රයධාරී සොළී භික්ෂූන් ලංකාවට ගෙන්වා ශාසනයත් ,භාෂා සාහිත්‍යයත් දියුණු කල බව ඓතිහාසික තොරතුරු පෙන්වා දෙයි.එසේම එකල උගත් භික්ෂූන් මෙන්ම ධර්ම ග්‍රන්ථද ,තර්ක ව්‍යාකරණාදී ග්‍රන්ථද දුර්ලභව පැවති බැවින් රජතුමා ඒ සියල්ලම මෙහි ගෙන්වා අධ්‍යාපනය හා සාහිත්‍ය දියුණු කළ බව සඳහන් වෙයි. මෙසේ ලක්දිවට පැමිණි භික්ෂූන් අතර තඹරට ධම්මකිත්ති ස්ථවිරයාණෝද විශේෂ වෙති.දෙමළ භාෂාඥයකු ලෙස ප්‍රසිද්ධ උන්වහන්සේ විසින් පාලි මහාවංසයත් (සිරිමෙවන් රජුගේ පටන් පරාක්‍රමබාහු යුගය දක්වා) දාඨාවංසය පද්‍ය කාව්‍යයක් ලියන ලද බව සඳහන් වෙයි.

i. ශාසනික හා ශාස්ත්‍රීය වශයෙන් අමරණීය සේවයක් කළ භික්ෂූන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න.
ii. II වන පරාක්‍රමබාහු රජු මෙරට අධ්‍යාපනය හා සාහිත්‍ය දියුණුවට කළ සේවය කුමක්ද?
iii. බුද්ධඝෝෂ හිමියන්ගේ මව්භාෂාව වූයේ කුමක්ද?
iv. දෙමළ වචන ,දෙමළ භාෂාගත යෙදුම් සිංහල භාෂාවට ඇතුළු වූ හේතු දෙකක් ලියන්න.
v. පහත සඳහන් වචනවල තේරුම ලියන්න .
   1. ද්වීභාෂක
   2. පඬුරු

(ලකුණු 5*2= 10 යි)

05) සංචරණ සීමා පැවති අවධියේ දීර්ඝ කාලයක් ප්‍රවාහන පද්ධතිය අක්‍රීයව තිබුණි. නැවත පාසල් ආරම්භ කිරීමත් සමඟ බස් ගමන් වාර වල යම් අඩුවක් වූ නිසා පාසල් ගුරුවරුන්ට නියමිත වේලාවට පාසල් යාමට සහ ඒම ගැටලුවක් වී ඇත. ඔබ ඔබේ පාසලේ සමාජ විද්‍යා සංගමයේ ලේකම් අසංක සිරිවර්ධන යැයි සිතා ප්‍රවාහන ගැටලුවට විසඳුමක් ලබාදෙන ලෙස ඉල්ලා ප්‍රදේශයේ ඩිපෝ අධිකාරීතුමා වෙතට යැවීම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න.(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත්ය)

නැතහොත්

පහත දී ඇති තොරතුරු ඇසුරින් පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු විශේෂාංග ලිපියක් සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත්ය)

පාසල : සොඳුරුගම මිහිරිතැන්න විද්‍යාලය
ශ්‍රේණිය : 10 ශ්‍රේණිය
ශිෂ්‍යයා : ගයාන් සුසන්ත
නව නිපැයුම : සූර්ය ශක්ති තණකොළ කපන යන්ත්‍රය
එළි දැක්වූ දිනය : 2021.10.12
ස්ථානය : පාසල් ක්‍රීඩාංගනය
අනුග්‍රහය : ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
වාර්තාව සකසන ඔබ මිහිරිතැන්න වාර්තාකරු සුධීර සම්පත් යැයි සිතන්න.

(ලකුණු 15 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

## දෙවන වාර පරීක්ෂණය 2021
## Second Term Test

| 10 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය III | පැය 2 |
|---|---|---|

**මෙම ප්‍රශ්න පත්‍රය සඳහා හිමි ලකුණු ගණන 80කි.**
**1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු සපයන්න.**
**(I) සිට (X) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

---

(01) I. සිදු වේ මැයි වෙසෙස
මහ බෝ සතුන් අදහස
ඉන් සුර පුරෙන් බැස
අවුත් බෝසත්හු දිනවන ලෙස

(අ) මෙහි සඳහන්වන බෝසතුන්ගේ අදහස කුමක්ද?
(ආ) ඒ සඳහා බෝසතුන්ට උදව් කිරීමට පැමිණියේ කවුද?

II. (අ) 'බැද්දෙගම' නම් අනුවර්තන නවකතාවේ රජකයා නම් කරන්න.
(ආ) 'විලේජ් ඉන් ද ජංගල්' නම් කතාව ලියවුණු වර්ෂය කුමක්ද?

III. 'සබඳිනි, චූලනි බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ උයන සරහවා එක් සියයක් රජ දරුවන් පිරිවරා සුරා පානය අනුභව කරනු කැමැත්තෝය.'
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් ප්‍රකාශ කරන ලද්දක්ද?
(ආ) මෙහි සඳහන් උත්සවය සංවිධානය කරන්නේ කුමක් සඳහාද?

IV. (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුද?
(ආ) වෑත්තෑවේ හිමියන් ගුත්තිල කාව්‍ය සඳහා ගුත්තිල ජාතකය මූලාශ්‍ර කර ගැනීමට හේතුව කුමක්ද?

V. නහින දෙහින කාලෙට පින් කෙරුම යුත
බහින කලට කුරින් විල්වලින් එත
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත
..........................................................................
(අ) මෙම කවියේ හතර වන පදය සම්පූර්ණ කරන්න.
(ආ) අධික ප්‍රීතිය විනාශය කැඳවෙන බව කියවෙන පද්‍ය පාදය උපුටා ලියන්න.

VI. 'ආ, කවදාවත් ඕකෙන් පිට වෙලා එන්ඩ ඉඩ හම්බ වෙන්නෙ නෑ මිනිහෙකුට'
(අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
(ආ) මෙහි සඳහන් 'ඕකෙන්'යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

VII. (අ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක්ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු සියවස කුමක්ද?

VIII. (අ) පැරණි ජනයා විවේකය දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීමට කී කවි මොනවාද?
(ආ) සිංහල ජන කවියේ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් ලියන්න.

IX. ගුත්තිල මහ සිපී
සක්දෙව් බසින් සැතපී
මින් දිනමැයි දැපී
................................................
(අ) මෙම කවියේ හතරවන පදය සම්පූර්ණ කරන්න.
(ආ) 'සිපී' යන්නෙහි තේරුම ලියන්න.

X. (අ) සිංහල ජාතක කතාවේ ආකෘතික අංග තුන නම් කරන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත රචනා කිරීම සඳහා අනුග්‍රහය දැක්වූයේ කවුරුන්ද?

(ලකුණු 2 X 10 = 20යි)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි උත්තර ලියන්න.

I. වෙසෙසින් යන නද දිගත පුරායා
අසමින් <u>තුරු හිස</u> රදන ගිරායා
<u>උමුවෙන්</u> ගත් මී අඹ මයුරායා
දැමුවෙන් වෙණ නදම ය මියුරායා
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) සමස්ථ කවියේ තේරුම ලියන්න.

II. "ඉතා ම **<u>බඩ සා</u>** සැටිය කැමැත්තෙහි වී නම් තිලින් පොදියක් කොට බැඳ ගෙන ගොස් **<u>පැහැර පියා</u>** පිස ගෙන කා නො මිය" කීහ.
(අ) තද කළු අකුරින් මුද්‍රිත පද වල අර්ථ ලියන්න.
(ආ) මෙම සිදු වීම හා සම්බන්ධ අවස්ථාව පැහැදිලි කරන්න.

III. <u>රන් විමනේ</u> සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි <u>බරණින්</u> සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) දෙවැනි හා තුන්වෙනි කවි පදවල තේරුම ලියන්න.

IV. "තමාට කොටගොඩ නෑදැයන්ගෙන් ඉඩම් කැබැල්ලක් ලබා ගත හැකි බවත් එහි දී දූ දරුවන්ට **<u>හිර හිඳලන්</u>** ගැනීම වඩා හොඳින් කර ගත හැකි බවත් ඈ දැන සිටියාය. ආරච්චි මායියා හැමදාමත් කීවේ මේ ගම කිසි කලක නිසි කෙනෙකුට **<u>වගතුවක්</u>** නොවන සාප ලත් ගමක් බවය. "
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) මෙම තැනැත්තිය කොටගොඩ යාමට තීරණය කළ හේතු දෙකක් ලියන්න.

V. "මේ රජ්ජුරුවෝ ඉතා මරණ භයින් භයපත් වැ ගියාහ. රෝගයෙන් පෙළෙන එකක් හට අවස්ථා පිළියමක් දන්නා වෙදකු පිළිසරණ වන්නා සේ ද සා දුකින් පෙළෙන එකෙකුට භෝජනය මුත් අනෙකක් පිළිසරණ නොවන්නා සේද "
(අ) මෙම සිදුවීම කවර අවස්ථාවක් හා සම්බන්ධ වේද?
(ආ) මෙහි සඳහන් උපමාවක් හා උපමේයක් සඳහන් කරන්න. (ලකුණු 4 X 5 = 20යි)

(03)
I. පති භක්තියක්
II. ධෛර්ය සම්පන්නභාවයක් නිසා ........... 'පුංචි මැණිකා' පාඨක මනසෙහි රැඳී පවතින චරිතයකි. බැද්දෙගම නවකතාව ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් විමසන්න.

**නැතහොත්**

I. කාව්‍යාලංකාර භාවිතයත්
II. උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත් නිසා ......'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පද්‍ය පන්තිය සාර්ථක වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

(04) ගුත්තිල පඬිතුමාගේ වීණා නාදයේ මිහිරියාව ...
I. විවිධ විරිත් භාවිතයත්
II. සරල භාෂා ව්‍යවහාරයත් නිසා වඩාත් තීව්‍ර වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

I. ප්‍රඥා මහිමයත්
II. දැඩි මසුරුකමත් .... උම්මග්ග ජාතක කතාවේ චරිත තුළින් නිරූපණය වේ. සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරින් එක් කොටසකට උදාහරණ දෙක බැගින් ඉදිරිපත් කරමින් විමසන්න. (ලකුණු 15යි)

(05) සුචරිතවත් ජීවිතයකට ආදර්ශ ලබා දීම ජන කවියාගේ අරමුණයි. හානා හීය පානා අඬහැරෙන් දැනේ පද්‍ය පන්තිය ඇසුරින් උදාහරණ <u>තුනක්</u> ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) බෝධි සත්ත්ව චරිතයේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම ජාතක කතාකරුවාගේ ප්‍රධාන අරමුණ වී ඇත. සතර කන් මන්ත්‍රණය පාඩම ඇසුරෙන් උදාහරණ තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) වීණා වාදයේ මිහිර වර්ණනා කිරීමට අපූර්ව වූ සංසිද්ධින් චිත්තරූප මවමින් ඉදිරිපත් කිරීමට ගුත්තිල කවියා සමත් වී ඇති ආකාරය උචිත නිදසුන් තුනක් ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය 2021
Second Term Test

10

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු හා ලකුණු දීමේ ක්‍රමය - I

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (2) | 21 - (3) | 31 - (4) |
| 2 - (4) | 12 - (3) | 22 - (2) | 32 - (1) |
| 3 - (3) | 13 - (1) | 23 - (4) | 33 - (3) |
| 4 - (1) | 14 - (3) | 24 - (1) | 34 - (1) |
| 5 - (3) | 15 - (1) | 25 - (4) | 35 - (4) |
| 6 - (2) | 16 - (4) | 26 - (2) | 36 - (2) |
| 7 - (1) | 17 - (2) | 27 - (1) | 37 - (3) |
| 8 - (4) | 18 - (3) | 28 - (3) | 38 - (4) |
| 9 - (2) | 19 - (4) | 29 - (2) | 39 - (1) |
| 10 - (4) | 20 - (1) | 30 - (2) | 40 - (3) |

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු හා ලකුණු දීමේ ක්‍රමය. - II

(01)

I. (අ) ස්වර හා ව්‍යංජන / ගතකුරු හා පණකුරු / ගාත්‍රාක්ෂර හා ප්‍රාණාක්ෂර

(ආ) ක , ච , ට , ත , ප
ඛ , ඡ , ඨ , ථ , ඵ
ශ , ෂ , ස , අඃ , ෆ

II. (අ) සුළු - කුඩා යන අර්ථය ප්‍රකාශ විය යුතුය.

(ආ) සුලු - ස්වභාවය

III. (අ) අවස්ථෝචිත , සම්මිශ්‍රණය

IV. (අ) බල , බලන්න , බලපන් , බලපිය , බලනවා , බලනවා හොඳයි , බලග

(ආ) බලද්දී , බලත , බලන විට / බලන කල්හි / බලන අවස්ථාවේ

V. (අ) ශිෂ්‍යයෝ පස්දෙනෙක් පාසලට පැමිණියහ.

(ආ) අප වසංගත රෝගවලින් නිදහස් වන්නේ කවදා ද?

VI. (අ) පුරාණ කාලයට අයත් / පෞරාණික (ආ) මුහුදු හා සමාන

VII. (අ) දරු + ඕ (ආ) වැදි+ආ

VIII. (අ) ස්ථිර වචනයක් ( ප්‍රතිපත්තියක් ) නොමැත්තා (ආ) බොරු සිල් ගැනීම

IX. (අ) අප විසින් වසංගත රෝග මැඩලීමට සෞඛ්‍ය පුරුදු පිළිපදිනු ලබයි / ලැබේ / පිළිපැදේ.

(ආ) දරුවන් විසින් ආදරයෙන් දෙමව්පියෝ පෝෂණය කරන ලදහ. / ලද්දාහ. / ලද්දෝය. / ලැබූහ.

X. (අ) හෙවනැල්ල (ආ) සීයා

(02) රචනය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.

01. සාරවත්භාවය - මාතෘකාව ද ඇතුළුව

තේමාවට අදාළ බව , ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව , සරු බව හා සම බව , වචන ගණන 250 සමීපව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ .

මාතෘකාව 01 යි
සාරවත්භාවයට 07 යි
08 යි

02. සංවිධානය , නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ( ලකුණු 12 යි)
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය , සංවිධානය , ස්වීයත්වය , නිර්මාණාත්මක ප්‍රකාශනය , ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්‍ෂතාවය සහ ඡේද බෙදා ලිවීම - ( ලකුණු 05 යි )

වියරණ , අත් අකුරු , විරාම ලක්‍ෂණ භාවිතය , ඡේද අදාල පරිදි වෙන් කොට තිබීම , පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

**03.සාරාංශය**

මුළු ලකුණු 10යි.

01. අන්තර්ගතය - ලකුණු 06යි

02. වචන ගණන - ලකුණු 02යි

03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02යි

අන්තර්ගතය

(i) මිනිසා අභ්‍යවකාශය ජයගෙන ඇති බව

(ii) සන්නිවේදන මෙවලම් පරිශීලනයෙන් ළමයාගේ බුද්ධිමය, නිම්වළලු පුළුල් විය යුතුය.

(iii) ළමයා දැනුම ග්‍රහනය කරගත යුත්තේ තමා ජීවත්වන සමාජයට හා අවට පරිසරයට ගැළපෙන අයුරිනි.

(iv) එසේ නොවූ හොත් ඔහු අක්මුල් නැති රොබෝවෙකි.

(v) දෙමව්පියන් ගුරුවරුන් ළමයාගේ කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම් කළ යුතුය.

(vi) පූර්ණ ජීවිතයකට බුද්ධිමය ජයග්‍රහණ සමහ සාරධර්ම හැසිරීම් මත ගොඩනැගුණු සමතුලිතභාවයක් පවත්වා ගැනිම වැදගත්ය.

04.(i) බුද්ධඝෝෂ හිමි හා ධම්මපාල හිමි

(ii) ඉන්දියාවෙන් උගත් භික්ෂූන් ගෙන් වීම සහ මෙරට දුර්ලභව පැවති ධර්ම ග්‍රන්ථ හා තර්ක ව්‍යාකරණාදි ග්‍රන්ථ ගෙන්වීම

(iii) තෙලිඟු භාෂාව

(iv) ඉන්දියාවෙන් වැඩම කළ ධම්මපාල හිමිගේ මව්භාෂාව දෙමළ වීම

දෙමළ භාෂාඥයෙකු වූ තඹරට ධම්මකිත්ති හිමි පාලි මහාවංසයත් , දයාවංස පද්‍ය කාව්‍යයත් ලිවීම

(v) භාෂා දෙකක් දන්නා

තෑගි / ත්‍යාග

05. රාජකාරි ලිපිය ලකුණු 15යි

ආකෘතිය ලකුණු 05යි

1.යවන්නාගේ ලිපිනය ලකුණු 01යි

2.දිනය ලකුණු 01යි

3.ලබන්නාගේ ලිපිනය ආමන්ත්‍රණය ලකුණු 01යි

4 මාතෘකාව ලකුණු 01යි

5. අත්සන,නමහා තනතුර ලකුණු 01යි

අන්තර්ගතය - ලකුණු 07යි

1.ප්‍රවාහන පද්ධතිය අක්‍රීය බව ලකුණු 01යි

2.පාසල් ආරම්භ කළ බව ලකුණු 01යි

3.දරුවන් පාසලට පැමිණීම අඩුබව ලකුණු 01යි

4බස් ගමන් වාර අඩු බව ලකුණු 01යි

5.මතු වී ඇති ගැටළුකාරි බව ලකුණු 01යි

6. බස්රථ ධාවනය කළයුතු වේලාවන් ලකුණු 01යි

7. ඩිපෝ අධිකාරිගේ කරනු ලබන ඉල්ලිම ලකුණු 01යි

ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

නිවැරදි අක්ෂර වින්‍යාසය ,උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය,පැහැදිළි අත් අකුරු , නිවැරදි පද බෙදීම,වියරණ, විරාමලක්ෂණ,ඡේද වෙන් කිරිම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දියබ හැකි උපරිමයලකුණු 03කි.

**පුවත්පත් වාර්තාව ( විශේෂාංග ලිපි )**

**ආකෘතිය - ( ලකුණු 04 යි )**

1. මාතෘකාවට - ලකුණු 01 යි
2. වාර්තා කරන්නේ කවුරුන් ද යන වග - ලකුණු 01 යි
3. යෝග්‍ය සිද්ධි ගලපි තිබීම - ලකුණු 02 යි

**අන්තර්ගතය ( ලකුණු 08 යි )**

1. පාසලේ නම ලකුණු 01 යි
2. ශ්‍රේණිය ලකුණු 01 යි
3. ශිෂ්‍යයාගේ නම ලකුණු 01 යි
4. නව නිපැයුමේ නම ලකුණු 01 යි
5. එළි දක්වන දිනය ලකුණු 01 යි
6. ස්ථානය ලකුණු 01 යි
7. අනුග්‍රහය දක්වන්නේ කවුද යන වග ලකුණු 01 යි
8. සමස්තය ලකුණු 01 යි

**ශිල්පීය දක්‍ෂතා - ( ලකුණු 03 යි )**

නිවැරදි අක්‍ෂර වින්‍යාසය , උක්ත අඛ්‍යාත පද සම්බන්ධය , පැහැදිලි අත් අකුරු , නිවැරදි පද බෙදීම , වියරණ , විරාම ලක්‍ෂණ , ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.
- නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**දෙවන වාර පරීක්ෂණය 2021**
**Second Term Test**

**10**

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු හා ලකුණු දීමේ ක්‍රමය.

(01)

i. (අ) වීණා වාදනය තරඟයෙන් ජයග්‍රහණය ලැබීම. (ආ) සක්දෙව් රජ/ ශක්‍ර දේවේන්ද්‍රයා
ii. (අ)ඒ.පී. ගුණරත්න මහතා (ආ) 1913
iii. (අ) මහෞෂධ පඬිතුමා (ආ) එක් සියයක් රජදරුවන් විෂ සහිත මත්පැන් පොවා මැරීමට
iv. (අ) සලාවත ජයපාල මැතිඳුන් (ආ) තමා අකෘතඥයකු නොවන බව ගුරු හිමියන්ට ප්‍රකාශ කිරීමට
v. (අ)බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත (ආ)වහින කලට කුරින් විල් වලින් එත
vi. (අ)සිර ගෙදර අසල සිටි මහල්ලා (ආ)හිර ගෙදරින්
vii. (අ)පාලිජාතකට්ඨ කථාව (ආ) දා හතරවන සියවස - 14
viii. (අ)තේරවිලි කවි
(ආ) සරල උපමා හා රූපක භාවිතය , කට වහර,එදිනෙදා ජීවිතය හා බැඳුණු සිදුවීම් හා හැඟීම් අන්තර්ගත වීම.
ix. (අ)බඹර තත පළමුවෙන් සිද පී (ආ)ශිලිපියා / ශිල්පය දත්ත පුද්ගලයා
x. (අ) වර්තමාන කතාව, අතීත කතාව, සමෝධානය (ආ) වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයා

(02)

I. (අ) ගස් මුදුන් ආශාවන් /උත්මුඛයෙන්
(ආ)සතර දිශාව පුරා පැතිරියන වීණා වාදනය විශේෂයෙන් අසමින් ගස් මුදුන් වල රැදී සිටි ගිරවු මධුර වූ මිහිරි මී අඹ ඉතාමත් ආශාවෙන් කෑමට ගත් නමුත් ඊට වඩා වීණා නාදය මිහිරි නිසා අඹ ගෙඩි ඉවතට දැමුවා
II. (අ) බඩගිනි / කුසගිනි පොතුහැර / වී වල පොතු ඉවත්කර
(ආ) කේවට්ටයා මියුලු නුවරට වී පැවැත්වූ අවස්ථාවේ නුවර තාප්පයෙන් පිටතට වී විසිකර තිබූ අවස්ථාව(එය වර පුරුෂයෙකු දුටු අවස්ථාවේ)
III. (අ) රත්රන් මාළිගාවක් අබරණ /අභරණ
(ආ) මී පැණි කැවත් බඩගිනි ඇතිවීම, මැණික් ආභරණ වලින් ශරීරය වැසුවත් ශරීරය දිරායාම
IV. (අ) අවාහ විවාහ යහපතක්, සෙතක්, දියුණුවක්
(ආ) කොටගොඩ නැයන්ගෙන් හොඳ ඉඩමක් ලබාගත හැකි වීමත්, දූ දරුවන්ට හොඳ ආවාහ විවාහ කර ගැනීමක් සඳහා
V. අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව මියුලු නුවර වටලා සිටින විට බියපත් වේදේහ පඬිතුමා පිහිට විය යුතුබව සඳහන් අවස්ථාව
(අ) උපමාව - පිළියමක් දන්නා වෙදා
උපමේය- මහෞෂධ පඬිතුමා
උපමාව- භෝජනයක් /ආහාරයක්
උපමේය - මහෞෂධ පඬිතුමා
උපමාව - සා දුකින් හා රෝගයෙන් පෙළෙන්නන්
උපමේය - වේදේහ රජු

(03) උදාහරණ හතරට (උද්ධෘත ) (ලකුණු 04) ප්‍රශ්නයට අදාල ප්‍රමාණවත් විස්තර විචාරයට (ලකුණු 11)

(04) උදාහරණ හතරට (උද්ධෘත ) (ලකුණු 04 යි) ප්‍රශ්නයට අදාළ ප්‍රමාණවත් විස්තර විචාරයට (ලකුණු 11)

(05), (06), (07) — උදාහරණ තුනට (උද්ධෘත) (ලකුණු 04)
ප්‍රශ්නයට අදාල ප්රමාණවත් විස්තර විචාරයට (ලකුණු 07)